# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ)

**වයිට් රෝස් පදනම සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා විසින්
2016 මැයි මස 04 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 පෙබරවාරි මස 29 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[104 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## වයිට් රෝස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"වයිට් රෝස් පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එහි පරමාර්ථ සහ ඊට අදාළ සියලු කාරණා ඵලදායී ආකාරයෙන් ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා කොළඹ දී මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී වයිට් රෝස් පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථයක් සහ කරුණු සඳහා ද, එකී පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2016 අංක    දරන වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව "වයිට් රෝස් පදනම" දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු " සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "වයිට් රෝස් පදනම " යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. වයිට් රෝස් පදනම සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථයක් සඳහා ද, ඒ පොදු පරමාර්ථ මෙසේ විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) රටේ සෑම ප්‍රදේශයකම ජීවත්වන අඩු වරප්‍රසාදලාභී පුද්ගලයන් සඳහා සිය මූලික අවශ්‍යතා ඉටු කරගැනීමට සහය වීමෙන් පුද්ගලයන් තුළ පවතින ශක්‍යතාවයන් සහ හැකියාවන් සංවර්ධනය කිරීමෙන්, රැකියා ලබා ගැනීම සඳහා සහාය වීම සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය ප්‍රවර්ධනය කිරීම තුළින් සමාජ සේවාවන් සැපයීම ;

(ආ) මානසික සහ ශාරීරික ප්‍රගමනය උදෙසා ධනාත්මක වෙනසක් ඇති කළ හැකි ආකාරයෙන් නිර්මාණාත්මක කලාවන් හැදෑරීමට ළමයින්ට සහ තරුණයන්ට අවස්ථා උදාකරලීම තුළින් ඔවුන්ගේ ජීවිත කෙරෙහි යම් බලපෑමක් ඇති කිරීම ;

(ඇ) විවිධ දක්ෂතාවලින් පිරිපුන් පුද්ගලයින්ට ඒවා වඩාත් ඔප්නංවාගත හැකිවන ආකාරයෙන් අවස්ථා ප්‍රතිනිර්මාණය කර දීම සහ මූල්‍ය ආධාර ලබා දීම ;

(ඈ) නව දක්ෂතාවයන් ලබා ගැනීමටත්, රැකියා අතරතුර පුහුණුව ලබා ගැනීමටත් සිය ප්‍රජාවන් අතර දේශීය ව්‍යාපාර පිහිටුවා ගැනීම තුළින් රැකියාවන්ට යොමු වීමටත් අවශ්‍ය අවස්ථා තරුණයන් වෙත උදා කරදීම ;

(ඉ) රටේ පුරවැසියන්ගේ පොදු සුභසාධනය ප්‍රවර්ධනය කරලනු වස් සියලුම ප්‍රදේශයන්හි නොමිලේ වෛද්‍ය පහසුකම් අවශ්‍ය පුද්ගලයින් සඳහා නිදහස් වෛද්‍ය කඳවුරු සහ සායන සංවිධානය කිරීම සහ නොමිලේ බෙහෙත් වර්ග ලබා දීම ;

(ඊ) වඩාත් යහපත් අන්දමින් සිය ජීවිතය පවත්වා ගැනීමට සහාය වෙමින් ශ්‍රී ලංකාවේ වෙසෙන ඕනෑම ජාතියකට ගිණුම්කරණය, මූල්‍ය, නෛතික සහ වෙනත් වෘත්තීමය සහාය සහ උපදෙස් සැපයීම ;

(උ) දිවයිනෙහි ජීවත්වන විවිධ ජාතීන් අතර එකමුතුකම ඇති කරලීම උදෙසා සාමාජීය, අධ්‍යාත්මික සහ සංස්කෘතික ක්‍රියාකාරකම් නැංවීම සහ එකිනෙකා පිළිබඳ දැනුවත්වීම සහ අවබෝධය වර්ධනය කිරීම ;

(ඌ) ඉඩම් සහ නිවාස අහිමි පවුල් සඳහා ඉඩම් සහ නිවාස සැපයීම ;

(එ) විද්‍යාත්මක විෂය ක්ෂේත්‍රයට වැඩිදුරටත් නැඹුරු කරලීම උදෙසා දීප ව්‍යාප්ත තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සහ ඒ තුළින් රටේ සංවර්ධනයක් ඇති කිරීම ;

(ඒ) අමතර පහසුකම් නොමැති පාසල් සහ පුහුණු මධ්‍යස්ථාන වෙත අනෙකුත් යටිතල පහසුකම් ලබා දීම ;

(ඹ) දිවයිනේ පරිගනක සාක්ෂරතාවය ඉහල නැංවීමේ අදහසින් පාසල්, විශ්වවිද්‍යාල සහ අනෙකුත් එවැනි ආයතනයන්හි පරිගනක භාවිතය වැඩිදියුණු කිරීමට සහාය වීම ;

(ඕ) අවශ්‍ය අවස්ථාවන්හි දී කෘෂිකාර්මික සහ ධීවර කර්මාන්ත සඳහා පහසුකම් සැපයීම ;

(ක) තරුණයන් සඳහා රැකියා උත්පාදනය වෙනුවෙන් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලට සහාය දැක්වීම ;

(ග) ඉහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කිරීම හා වැඩිදියුණු කිරීමට විවිධ වූ සහාය සහ මුල්‍ය ප්‍රදාන ලබා දීම ;

(ජ) ඉහත සඳහන් ව්‍යාපෘති වැඩිදියුණු කිරීම සඳහා එම අංශ කෙරෙහි උනන්දුවක් දක්වන දේශීය සහ විදේශීය පුද්ගලයන් මෙන්ම ආයතන සමග රැස්වීම්, සම්මන්ත්‍රණ, සමුළු ආදිය පැවැත්වීම තුළින් සම්බන්ධීකරණය කිරීම ;

(ට) වයිට් රෝස් පදනමේ පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීමේ අදහසින් ප්‍රදර්ශන, දේශණ, සම්මන්ත්‍රණ, සාකච්ඡා වැඩමුළු සහ වෙනත් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම එවැනි පොත්, සඟරා, පත්‍රිකා හා පුවත් පත් මුද්‍රණය කිරීම, ප්‍රකාශ කිරීම සහ බෙදා හැරීම ;

(ඩ) ඉහත කී පරමාර්ථ සියල්ල ම හෝ එක් පරමාර්ථයක් සිදු කිරීම සඳහා අවශ්‍ය විය හැකිවන එවැනි අනෙක් සියලුම ක්‍රියාවන් සිදු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට යටත් ව චංචල හෝ නිශ්චල දේපල අත්පත් කරගැනීමේ සහ රඳවා ගැනීමේ, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ අවසන් කිරීමේ ද, ඇපයක් සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ එකතු කිරීමේ, මුල්‍ය ප්‍රදාන, ආධාර ලබා ගැනීමේ හෝ එකතු කිරීමේ ද, ස්වකීය මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවට අයත් ඕනෑම ඉඩමක ඕනෑම ගොඩනැගිල්ලක හෝ ආකෘතියක් ස්ථාපිත කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථය ඉටු කර ගෙන යාම සඳහා අවශ්‍ය නිලධාරීන් සහ සේවකයන් බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ සහ සේවයෙන් අස් කිරීමේ බලපත්‍ර ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු ක්‍රියා, කාරණා සහ දේවල් ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

**5.** (1) සංස්ථාවේ කටයුතු මෙම පනතෙහි අනෙකුත් විධිවිධාන සහ සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව සභාපති, උප සභාපති, කළමනාකරණ අධ්‍යක්ෂ, ලේකම් හා භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට යටත් ව උපරිම වශයෙන් හත් දෙනෙක් දක්වා වූ අධ්‍යක්ෂවරුන්ගෙන් තෝරා පත් කරගත් අධ්‍යක්ෂ මණ්ඩලයක් (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මෙම පනත ආරම්භ වන දිනයට ආසන්න වශයෙන් පෙරාතුවම වූ දිනයේ දී ධුරය දැරූ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය. එවැනි මණ්ඩලයක් සංස්ථාවේ රීතින්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරා පත් කර ගන්නා තෙක් රැඳී සිටිය යුතු ය.

**සංස්ථාවේ රීති.**

**6.** (1) මෙම පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීතියක් පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට සහ එහි කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් අදාළ වන වෙනත් ඕනෑම කරුණක් ඕනෑම මහා සභා රැස්වීමක දී සහ සාමාජිකයන් 2/3 කට නොඅඩු බහුතර ඡන්දයකින් කලින් කලට සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ගීකරණය සහ සාමාජික ගාස්තු ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ ඔවුන්ගේ බලතල හා කාර්යභාරයන් ;

(ඇ) නිලධාරි මණ්ඩල තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ සේවා ලබා දීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, සේවය හැර යාම හෝ සේවයෙන් ඉවත් කිරීම හා ඔවුන්ගේ බලතල සහ කාර්ය භාරයන් ;

(ඈ) සභාවේ රැස්වීම් සඳහා කැඳවීමේ දී සහ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය ගණපූරණය සහ ඒ අනුව කාර්ය ස්වභාවය ;

(ඉ) අරමුදල් ඇතුළුව සංස්ථාවේ දේපල පරිපාලනය හා කළමනාකරණය.

(2) සංස්ථාව මගින් සාදනු ලබන ඕනෑම රීතියක් වෙනස් කිරීම, අලුතින් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම, රැස්වීමක හා එවැනි උපවගන්ති (1) යටතේ සාදනු ලැබූ රීතියක් මෙන් කළ හැකි ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට තමා සතු අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, දායක මුදල්, අන්තිම කැමති පත්‍රයෙන් දේපල බැහැර කිරීමක්, ගාස්තු, පරිත්‍යාග සඳහා වන ප්‍රදාන හෝ මුදලින් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන දායකත්වයන් ආදී දේශීය හා විදේශීය ආයතන සහ පුද්ගලයින්, සාමාජිකයන් හා සාමාජිකයන් නොවන තැනැත්තන්ගෙන් ලැබීම් යනා දී වශයෙන් මේ දක්වා හෝ මින් මතු භාරගනු ලබන සියලුම මුදල්.

(2) ලැබෙන සියලුම මුදල් සංස්ථාවේ නමින් එක් බැංකුවක හෝ බැංකු කිහිපයක තැන්පත් කළ යුතු අතර, මණ්ඩලය තීරණය කරනු ලබන ඕනෑම ආකාරයකින් ආයෝජනය කළ හැකි ය.

(3) සංස්ථාවේ බලතල, කාර්යභාරයන් සහ ඊට අදාළ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද සියලුම වියදම් සංස්ථාවේ අරමුදල් මගින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු හා සංස්ථාවට අයවිය යුතු ණය.

**8.** මෙම පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයෙහි පැවති සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනම සංගමයට ගෙවිය යුතුව තිබූ සියලු ණය, දායක මුදල් හා පරිත්‍යාග මෙම පනතේ අරමුණ සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**9.** සාමාජික ගාස්තු වශයෙන් සාමාජිකයකුගෙන් අයවිය යුතු මුදල් ඉක්මවූ කිසිදු මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයන් සඳහා ගෙවීමට කිසිදු සාමාජිකයකු යටත් නොවන්නේ ය.

*සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව.*

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක් භාරයට පත් කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන්නා වූ චංචල හෝ නිශ්චල දේපලක් භාරයේ තබාගැනීමට නීතියෙන් සංස්ථාවට හැකිවන අතර, මෙම පනතේ පරමාර්ථයන්ට අනුව සංස්ථාව සතු ඒ සියලු දේපල විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සහ භාරයේ පවතින අවස්ථාවක දී භාරකාර මණ්ඩලයක් මගින් සපයන ලද ආකාරයෙන් කටයුතු කිරීමටත් පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත් ව මේ පනතින් කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

**11.** (1) සංස්ථාවේ මුද්‍රාව සංස්ථාව විසින් තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව බලය පවරනු ලැබූ පුද්ගලයන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයක් වෙනුවෙන් භාවිතා නොකල යුතු යි. ඔවුන් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, එය සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිභාහිරව විය යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**13.** මෙම පනතේ සිංහල, හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.